ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - **4** මට්ටම
අවසාන පරීක්ෂණය- **2023/2024**
**LLU 4806** අපරාධ නීතිය
කාලය - පැය **3**

---

දිනය -: **2024** මැයි **18** වේලාව -: ප.ව. **1.30 –** ප.ව **04.30**

---

මුළු ප්‍රශ්න ගණන - 08

ප්‍රශ්න <u>05 කට පමණක්</u> පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1.“න්‍යායාත්මකව ගත් විට අපරාධයක මූලාංග වන සදෝෂී ක්‍රියා ධාතුව හා සදෝෂී මානසික ධාතුව මගින් වෙනස් වූ කර්තව්‍යයන් ඉටු කරයි. සදෝෂී ක්‍රියා ධාතුව හෙවත් අපරාධයක බාහිර මූලාංගය මගින් සමාජයක හැසිරීම පිළිබඳ රීතිවල හරය පිළිබිඹු කරයි. එනම් අපට කළ හැකි හා කළ නොහැකි දේ ඉන් පවසයි."

William Wilson, *Criminal Law (1st edn,Addison Wesley Longman Ltd ,1998)p.65*

ඉහත ප්‍රකාශය ඇසුරෙන් ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය යටතේ අපරාධ වගකීම සංස්ථාපනය කිරිම සඳහා සදෝෂී ක්‍රියා ධාතුව හා සදෝශී මානසික ධාතුව යන මූලධර්මයන්ගේ අදාලත්වය සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු තීන්දු මගින් පහදන්න.

(ලකුණු 20)

2.ත්‍රී රෝද රථ රියදුරෙකු වන නිමේෂ් අවන්හලක හිමිකරුවකු වන රමේෂ් සමඟ කාලයක් සිට පවතින ගැටුමක් තිබේ. එක් දිනක් නිමේෂ් , රමේෂ්ගේ අවන්හලෙහි පිවිසුම අවහිර වන අන්දමින් ඔහුගේ ත්‍රීවිල් රථය රමේෂ්ගේ අවන්හල ඉදිරිපස නතර කළේය.රමේශ් සහ නිමේෂ් අතර උණුසුම් විවාදයක් ඇති විය. ඔවුන් එකිනෙකාට පහරදීමට පටන් ගත් අතර පහරදීම අතරතුර රමේශ් අවන්හල තුළට දිව ගියේය. ඔහු පිහියක් අතට ගෙන නිමේෂ්ගේ උදරයට කිහිප වතාවක් ඇන්නේය. සිද්ධිය දුටු පුද්ගලයකු නිමේශ්ව රෝහලකට රැගෙන ගියේය. කෙසේ නමුත් රෝහලට ඇතුළත් කිරීමේ ප්‍රමාදයක් සිදුවූ අතර තුවාල නිසි ලෙස හඳුනා ගැනීමටත් යෝග්‍ය ප්‍රතිකාර මාලාවක් නියම කිරීමටත් වෛද්‍යවරයා අසමත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස නිමේෂ් මරණයට පත්විය. මරණ පරීක්ෂණය සිදු කළ අධිකරණ වෛද්‍ය විශේෂඥවරු

හෙළි කළේ නියමිත වේලාවට ප්‍රතිකාර කළේ නම් නිමේෂ්ගේ ජීවිතය බේරා ගැනීමට හැකියාව පැවතුණු බවයි.

රමේෂ්ට එරෙහිව ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය යටතේ මිනීමැරීමට අදාළ චෝදනා ගොනුකර ඇත. දැන් ඔහුගේ තර්කය වන්නේ මරණයට සැබෑ හේතුව වෛද්‍යවරයාගේ නොසැලකිලිමත්කම බවයි.

ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය යටතේ කාරණත්වය පිළිබඳ මූලධර්මය ඇසුරෙන් ඉහත සිද්ධිමය කරුණ සාකච්ඡා කරන්න.

ඔබගේ පිළිතුර ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීරණ මගින් පහදන්න.

**(ලකුණු 20)**

3."සාක්ෂිය යන පදය සාමාන්‍යයෙන් භාවිතා කරනු ලබන්නේ වෙනත් කරුණක පැවැත්ම පිළිබඳව මනසෙහි ඇතිවන වැටහීමක් ඇඟවීමටය."

Lyman R Patterson, *'The Types of Evidence: An analysis'* (1965)19 Vand L Rev 1

ඉහත ප්‍රකාශය ඇසුරෙන් විවිධ සාක්ෂි වර්ග පිළිබඳ පැහැදිලි කරන්න. ඔබගේ පිළිතුර ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීරණ මගින් පහදන්න.

**(ලකුණු 20)**

4.ගයාන් හා රණවක බොරැල්ලේ පිහිටි ජනාකීර්ණ මහල් නිවාස සංකීර්ණයක අසල්වාසීන් වෙති. මෑතකදී සිදු කළ මොළයේ සැත්කමක් හේතුවෙන් බරපතල සෞඛ්‍ය තත්ත්වයක සිටින සහ දැනටත් හදවත් රෝගී තත්ත්වයන් ඇති රණවක හට දින කිහිපයක සිට බාධාකාරී වන අයුරින් ගයාන්ගේ නිවස දෙසින් ඝෝෂාකාරී සංගීතයක් ඇසුණි.රණවකට එයින් අපහසු ගතියක් දැනී එම ශබ්දය මගින් ඔහුගේ අසනීප තත්ත්වය උග්‍ර කරන බව පවසමින් එම ඝෝෂාකාරී සංගීතය නවතන ලෙසට ආචාරශීලී ලෙස ඔහු ඉල්ලා සිටියේය.රණවකගේ රෝගී තත්ත්වය පිළිබඳ හොඳින් දන්නා ගයාන් රණවකගේ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ අතර ඉන් පසු උණුසුම් කතාබහක් ඇති විය. ගයාන් ක්ෂණිකවම රණවකගේ හිසට විශාල ලී මුගුරකින් පහර දුන් අතර ඔහුව වැරෙන් තල්ලු කළ අතර එමගින් ඔහුගේ හිස බිත්තියේ වැදුණි. රණවකව රෝහලට ඇතුළත් කරන ලද අතර ටික වේලාවකින් මොළය අභ්‍යන්තරයේ ලේ ගැලීමක් හේතුවෙන් ඔහු මරණයට පත් විය.

ඉහත සිද්ධිමය කරුණු ඇසුරෙන් ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ මිනීමැරීම පිළිබඳව ගයාන්ගේ අපරාධ වගකීම විශ්ලේෂණය කරන්න.

ඔබගේ පිළිතුර ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීරණ මගින් පහදන්න.

(ලකුණු 20)

5. "කායික තුවාල සිදු කිරීම පිළිබඳ නඩුවකදී, දඬුවමේ බරපතලභාවය මෙන්ම සදෝෂාන්තභාවයේ බරපතලභාවයද තීරණය කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහය යටතේ තුවාල කිරීම සහ බරපතල තුවාල සිදු කිරීම අතර දක්වා ඇති වෙනස තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි ".

සාකච්ඡා කරන්න.

ඔබගේ පිළිතුර ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීරණ මගින් පහදන්න.

(ලකුණු 20)

6.පහත සිද්ධි සලකා බලන්න;

(අ).අවුරුදු 25ක, රැකියා විරහිත තරුණයකු වන චාමර බැංකුවට ඇතුල්වන හා එයින් පිට වන මිනිසුන් දෙස බලමින් සිටියේය. මැදිවියේ පාසල් ගුරුවරයකු වන ඉරේෂ් බැංකුව අසල ඇති ATM යන්ත්‍රයෙන් මුදල් ආපසු ලබා ගැනීම දෙස ඔහු අවධානය යොමු කළේය.ඉරේෂ් මුදල් සිය පසුම්බිය තුළට දමා කුලීරථයක් ලබා ගැනීමට පාර දිගේ ගමන් කිරීමට පටන් ගත්තේය.

චාමර ඉරේෂ්ව ලුහුබැඳ ගිය අතර ඔවුන් හුදෙකලා විදියකට හැරුණු විට චාමර එක්වරම ඔහුගේ පිටුපසින් දිවගොස් ඉරේෂ්ගේ හිසට පිස්තෝලයක් එල්ල කරමින් ඉරේෂ්ගේ මුදල් පසුම්බිය උදුරා ගත්තේය.

(ලකුණු 10)

(ආ).හේමන්ති හා නිලන්ති යනු මිතුරන් වන අතර ඔවුන් කුඩා කේක් වෙළඳසැලක් ආරම්භ කිරීමට තීරණය කළහ. දෙදෙනාම රුපියල් පනස් දහසක් යෙදවීමට එකඟ වූ අතර ඔවුන්ගේ නමින් ඒකාබද්ධ ගිණුමක් විවෘත කිරීමේ වගකීම හේමන්ති හට පවරා දෙන ලදී. කෙසේ නමුත් ගිණුම විවෘත කිරීමේදී හටගත් ප්‍රමාදය හේතුවෙන්ඇය තමාගේ නමින් ගිණුම තාවකාලිකව ආරම්භ කළ අතර, මසකට පසුව එය ඒකාබද්ධ ගිණුමක් බවට පත් කරන බව ඇය පොරොන්දු වූවාය.

මාස දෙකක් පසුවද, ගිණුමේ පවත්නා ශේෂය පිළිබඳ තමා දැනුවත් නොකර ඇති බව නිලන්ති නිරීක්ෂණය කළාය. තවද ඇය විසින් ඒ පිළිබඳ විමසූ කල සියල්ල හොඳින් සිදුවන බව පවසමින් ඒ පිළිබඳ හෙළි කිරීම හේමන්ති ප්‍රතික්ෂේප කළාය.

අවසානයේ දී හේමන්ති විසින් යම් මුදල් ප්‍රමාණයක් ගිණුමෙන් ලබාගෙන එය ඇයගේ පුතාගේ පාසල් ගාස්තු ගෙවීමට භාවිත කර ඇති බවත් නිලන්ති විසින් අනාවරණය කරගත්තාය.

ඔබගේ පිළිතුර අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීරණ මගින් පහදන්න.

(ලකුණු 10)

7. "නිර්දෝෂී පුද්ගලයකු ලෙස නිදොස් කොට නිදහස් නොවුනත් ලිහිල් කිරීමේ ආයාචනා මගින් දඬුවම අවම කර ගැනීමට හැකිය."

ඉහත ප්‍රකාශය ඇසුරෙන් ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 294 වගන්තියට අදාළ ලිහිල් කිරීමේ ආයාචනා පිළිබඳව සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

8.පහත සඳහන් මාතෘකා අතරින් **<u>ඕනෑම දෙකක් (02)</u>** පිළිබඳව සටහන් ලියන්න.

(අ).යථාර්ථ වගකීම

(ආ).බලෙන් ලබා ගැනීම

(ඇ).අනුකූලතාවය හා ආවේශ්‍යතාවය

(ඇ). ස්ත්‍රී දූෂණය.

**(ලකුණු 5x4= 20)**

****සියළුම හිමිකම් ඇවිරිණි****